20

# සීරතුන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම්- II



## මදීනාවෙන් ආදර්ශවත් සමාජයක්

ශ්‍රේෂ්ඨ සහෝදර හැඟීම තුළින් වැඩුණු අනන්‍ය වූ ජන සමාජයක් නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා මදීනාව කේන්ද්‍ර කොට ගෙන බිහි කළේ ය. පරම්පරා ගණනාවක් මුළුල්ලේ සටන් වැද සිටි ඖස්, කස්රජ් ගෝත්‍රිකයන් අතර සමගිය ඇති කරන්නට එතුමාණෝ පුරෝගාමීව කටයුතු කළහ. මුස්ලිම්වරුන් විසින් ඉටු කළ ජමාඅත් සලාතය, ජුම්මා සලාතය, සව්මය, සකාත් වැනි වගකීම් ගණනාවක් මදීනාවේ දී අනිවාර්ය කරනු ලැබිණි. අංග සම්පූර්ණ ජීවන ක්‍රමයකට අවශ්‍ය නීති සම්පාදනය කරනු ලැබිණි. වැරදි කරන්නවුන්ට අදාළ දඬුවම් ද නියම කරනු ලැබිණි. නීතිය, අවංක භාවය, සමානත්වය, අන්‍යෝන්‍ය අවබෝධය, එකිනෙකාට උපකාර කිරීම යනාදී මෙකී නොකී යහ ගුණාංග රාශියකින් සමන්විත වූ නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ මෙම රාජ්‍ය පාලනය කාටත් පූර්වාදර්ශයක් වූ රාජ්‍ය පාලනයක් විය.

## යුදෙව්වරුන් සමඟ ගිවිසුම්වලට එළඹීම

මදීනාවේ වාසය කළේ මුස්ලිම්වරුන් පමණක් නොවේ. තවත් ජන වර්ග ගණනාවක් මදීනාව වාසස්ථාන කොට ගෙන ජීවත් වූහ. එයිනුත් වැඩි ප්‍රතිශතයක් ලෙස තිබූ යුදෙව් සමාජ සමඟ මුහම්මද් නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා ගිවිසුමක් ඇති කර ගත්තේ ය. මෙම ගිවිසුම "සහීෆතුල් මදීනා" යන නමින් හැඳින්වේ. මෙම ගිවිසුම මගින් ඉස්ලාමීය නොවන අන්‍ය සමාජවලට ආගම ඇදහීමේ හා විශ්වාස කිරීමේ අයිතිවාසිකම් හිමි කර දී තිබුණි.

මදීනා රාජ්‍යය සියලු දෙනා එකාවන් ව ආරක්ෂා කළ යුතු බව මෙහි දී අවධාරණය කරන ලදි. මෙම ගිවිසුම මගින් මදීනාව තුළ සන්සුන් සහ සාමකාමී වාතාවරණයක් ඇති වූ අතර ම මක්කාවෙන් එල්ල විය හැකි ඕනෑ ම හදිසි ප්‍රහාරයක් වැළැක්වීමේ හැකියාව ද මදීනා රාජ්‍යය සතු ව පැවතියේ ය.

## ගසවාත්

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන්ට යුධ සටන් ගණනාවකට මුහුණ දීමට සිදු වූ අතර ඒවාට නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් සෘජු ව ම සම්බන්ධ විය. ඒවා "ගසාවත්" ලෙස හැඳින්වේ. මේ සෑම යුද ප්‍රහාරයක දී ම අල්ලාහ්තආලා මුස්ලිම්වරුන්ට උපකාර කොට තම උතුම් ආගම වන ඉස්ලාම් ආගම ආරක්ෂා කළේ ය.

මුහම්මද් නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන්ට බද්ර්, උහද්, අහ්සාබ්, කෛබර්, හුනයින් වැනි ඉස්ලාම් විරෝධි යුද්ධවලට මුහුණ දීමට සිදු විය. යුද පිටියේ දී අනුගමනය කළ යුතු යැයි ඉස්ලාමය අණ කළ නීති අනිවාර්යයෙන්ම පිළිපැදිය යුතු යැයි නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් විසින් තම අනුගාමිකයන්ට අවධාරණය කරන ලදි. මෙසේ යුද පිටියක දී පිළිපැදිය යුතු යැයි නියම කරන ලද නීති අදටත් සියලු දෙනාට ම මහත් පූර්වාදර්ශයක් සපයා ඇති බව සිහි තබා ගත යුතුයි.

- සටන් කළ හැක්කේ, සීමාව ඉක්මවා අසාධාරණකම් කරන්නන් සමඟ පමණි. කිසි විටෙකත් පොදු ජනයාට පහර නොදිය යුතුයි.
- යුද පිටියේදී කාන්තාවන්ට, කුඩා ළමයින්ට, වයෝවෘද්ධයින්ට පහරදීමෙන් වැළකිය යුතු ය.

- ගස්කොළ, එල දරන ගස්, වගා බිම් විනාශ කිරීමෙන් වැළකිය යුතු ය.
- සතුරන් අමානුෂික වද හිංසාවට ලක් කිරීම හෝ අංග විකල කිරීම හෝ පිලිස්සීම හෝ නොකළ යුතු ය.
- ආගමික සිද්ධස්ථාන හෝ ආගමික නායකයන් ඉලක්ක කර ගනිමින් ප්‍රහාර එල්ල කිරීමෙන් වැළකිය යුතු ය.

මෙසේ නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් විසින් දේශනා කරන ලද යුද නීති ඕනෑ ම කාලයකට අදාළ කර ගත හැකි ඒවා විය. කෙටි කලක දී ඉතා හොඳ සමාජයක් අල්ලාහුතආලාගේ සහායෙන් නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා ගොඩනැඟීම ඓතිහාසික වාර්තාවකි. මයිකල් එච්. හාර්ට් යන පුද්ගලයා THE HUNDRED යන ග්‍රන්ථයේ ලෝකයේ බලපෑම් කළ අය අතරින් පළමු වැන්නා නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් බව පවසා ඇත.

මුහම්මද් නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් විසින් ජීවිතයේ සෑම අවස්ථාවක දී ම අපට පෙන්වා දෙන ලද පූර්වාදර්ශ ඉගෙන ඒවා අප ජීවිතයේ මාර්ගෝපදේශ බවට පත් කර ගැනීම සෑම මුස්ලිම්වරයෙකුගේ ම වගකීමකි. එවිට අප දෙලොව ම ජය ලබන බව නියත ය.

## අභ්‍යාස

**පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. මුහම්මද් නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් යුදෙව්වන් සමග මදීනාවේ දී ඇති කරගත් ගිවිසුම හඳුන්වන්නේ කුමන නමකින් ද?
2. මුහම්මද් නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් සහභාගි වූ යුද්ධ හඳුන්වන පොදු නාමය කුමක් ද? එයින් යුද්ධ තුනක් නම් කරන්න.
3. ඉස්ලාමය විසින් හඳුන්වා දෙන ලද යුද නීති හතරක් දක්වන්න.
4. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන්ගේ මදීනා ජීවිතයෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශ පහක් සඳහන් කරන්න.
5. මදීනා සමාජයේ උදාර ගතිගුණ පහක් ලැයිස්තු ගත කරන්න.